**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංක යටතේ වන විසර්ජන ගිණුම සහ සැසඳුම් ප්‍රකාශනය, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම් වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපණය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම් මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 13 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි **128(1)** විධිවිධානය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම. | 2.9.1, 2.4 |
| | | 2. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනයේ අඩුපාඩු | 2.9.2 |
| | | 3. අසම්පූර්ණ ලෙස ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම. | 2.3.1 |
| | | 4. අවිධිමත් ගනුදෙනු | 2.5 |
| | | 5. කළමනාකරණ දුර්වලතා | 2.8 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. අනුකූල නොවීම් | 2.13 |
| | | 2. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. | 2.12 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | 1. ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම.<br>2. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයන්<br>3. අපේක්ෂිත අරමුණු ඉටුනොවූ ව්‍යාපෘති<br>4. අග්‍රිම ගිණුම<br>5. වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් ලබාදුන් ප්‍රතිපාදනය උපයෝජනය කිරීමේ දුර්වලතා<br>6. විසඳා නොතිබෙන විගණන ඡේද<br>7. කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ අඩුපාඩු | 2.3.2(අ)<br>2.3.2(ආ)<br>2.3.2(ඇ)<br>2.11<br>2.9.2<br>2.7<br>2.14(ඇ) |
| 128 (1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | හිඟ හිටි ණය ශේෂ | 2.10 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ /සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවල දී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවට ද, මුදල් | පාඩු හා හානි | 2.6 |

රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව.

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්**

(අ) කොට්ඨාශ හා ගම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ කටයුතු සමායෝජනය කිරීම මෙන්ම නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමටත්, අදාළ ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයන් වශයෙන් කටයුතු කරමින් කරනු ලබන ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

(ඇ) විමධ්‍යගත අයවැය වැඩසටහන හා වෙනත් සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ගෙවීම්.

(ඇ) පළාත් සභාවට පැවරී ඇති කාර්යයන් සඳහා අවශ්‍ය විට සහභාගී වීම සහ එහිදී කළයුතු වන ආදායම් රැස්කිරීම සහ ගෙවීම් කටයුතු.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

<table>
<tr><th></th><th>දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති ආයතන</th><th>ස්ථාපිත කිරීමේ අධිකාරි බලය</th><th>කාර්යභාරය</th></tr>
<tr><td></td><td>ප්‍රාදේශීය ලේකම් කාර්යාල</td><td></td><td></td></tr>
<tr><td>(i)</td><td>ගාල්ල- කඩවත්සතර</td><td rowspan="19">1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරයන්) පනත</td><td rowspan="19">මධ්‍යම රජයෙන් සහ පළාත් සභාවලින් පවරනු ලබන පරිපාලන හා සංවර්ධන කාර්යභාරයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.</td></tr>
<tr><td>(ii)</td><td>බෝපෙ - පෝද්දල</td></tr>
<tr><td>(iii)</td><td>අක්මීමන</td></tr>
<tr><td>(iv)</td><td>ඇල්පිටිය</td></tr>
<tr><td>(v)</td><td>නියාගම</td></tr>
<tr><td>(vi)</td><td>නාගොඩ</td></tr>
<tr><td>(vii)</td><td>වැලිවිටිය - දිවිතුර</td></tr>
<tr><td>(viii)</td><td>බද්දේගම</td></tr>
<tr><td>(ix)</td><td>ඉමදූව</td></tr>
<tr><td>(x)</td><td>ගෝනපීනුවල</td></tr>
<tr><td>(xi)</td><td>නෙළුව</td></tr>
<tr><td>(xii)</td><td>තවලම</td></tr>
<tr><td>(xiii)</td><td>කරන්දෙණිය</td></tr>
<tr><td>(xiv)</td><td>හික්කඩුව</td></tr>
<tr><td>(xv)</td><td>අම්බලන්ගොඩ</td></tr>
<tr><td>(xvi)</td><td>බෙන්තොට</td></tr>
<tr><td>(xvii)</td><td>යක්කලමුල්ල</td></tr>
<tr><td>(xviii)</td><td>බලපිටිය</td></tr>
<tr><td>(xix)</td><td>හබරාදූව</td></tr>
</table>

## 2.3 කාර්යසාධනය

### 2.3.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතන 19 හි අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කෙරෙන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**--------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා ආරම්භ කර තිබූ ව්‍යාපෘති අතුරින් රු. මිලියන 9.918 ක් වූ ව්‍යාපෘති හයක් නිම නොකර අත්හැරදමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවයන්**

**---------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(i) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

---------------------------------------------

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 4 ක 2015, 2016 හා 2017 වර්ෂවල ප්‍රතිපාදන මඟින් රු.5,733,435ක් වියදම් කර ප්‍රජා ශාලා 04 ක් ඉදිකිරීම අරඹා තිබුණි. මෙහිදි ව්‍යාපෘති තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු නිර්ණායකයන්ගෙන් එකක් ලෙස එම ව්‍යාපෘති සඳහා අයවැය මඟින් වෙන් කර ඇති මුදල් සීමාව තුළ සිදු කළ හැකි ව්‍යාපෘති හඳුනාගත යුතු වුවත්, ඒ පිළිබඳව නොසලකා හැර මෙම ගොඩනැගිලිවල ඉදිකිරීම් ආරම්භ කර වර්ෂ 02 ක ප්‍රතිපාදන යොදවා තිබුණි. එසේ නමුත්, ඉදිකිරීම් අවසන් කර නොතිබීම හේතුවෙන් 2017 අගෝස්තු 28 දින වනවිටත් මෙම ගොඩනැගිලි භාවිතයට ගත නොහැකි වී තිබුණි.

(ii) අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

--------------------------------------------

- 2016 වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ලබාදුන් මුදල් ප්‍රතිපාදන යොදාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ලෙහි පරිශ්‍රය වටා වර්ග මීටර් 185.8 ක කුට්ටි ගල් ඇතිරීම සඳහා රු. 633,300 ක් ඇස්තමේන්තු කර තිබූ අතර ඇස්තමේන්තුගත පිරිවිතරවලට පටහැනිව ප්‍රමිතියෙන් තොරව කාර්යය නිමකර තිබූ අතර ඒ සඳහා රු.165,163 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- 2017 වර්ෂයේදී මෙම ගොඩනැගිල්ල වටා ඉතිරි කොටසෙහි වර්ග මීටර් 712.5 ක ප්‍රමාණය තුළ කුට්ටි ගල් ඇතිරීම සඳහා රු.2,884,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ සඳහා ලංසු කැඳවීමකින් තොරව නව ගොඩනැගිල්ල ඉදිකර තිබූ කොන්ත්‍රාත්කරු වෙතම ලබාදීමට දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව අතුරා තිබූ කුට්ටි ගල්වල සම්පීඩක ශක්තිය පිළිබඳ පරීක්ෂාවේ දී නියැදිය සඳහා යොදාගත් කුට්ටි ගල් 06 ම නියමිත සම්පීඩක ශක්තිය කරා ළඟා වී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රමිතියෙන් තොර මෙම ව්‍යාපෘතිය සඳහාද කොන්ත්‍රාත්කරු ඉල්ලුම් කළ ඒකක මිල ගණන් අනුවම වැඩ වටිනාකම සහ එකතු කළ අගය මත බදු ඇතුලත්ව රු.2,810,678 ක් ගෙවා තිබුණි.

(iii) හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

-----------------------------------------------

- කොග්ගල මෝදරගොඩ කාණු පද්ධතිය සකස් කිරීමේ වැඩසටහන යටතේ දිග අඩි 270 ක්, පළල අඩි 1.8 ක් හා උස අඩි 1.17 කින් යුතු මෙම කාණු පද්ධතිය ඉදි කිරීම සඳහා රු.525,000 ක් වටිනා ඇස්තමේන්තුවක් සකස් කර වැඩ වටිනාකම රු.515,492 ක් යටතේ වැඩිහිටි සංවිධානයක් සමග 2017 නොවැම්බර් 01 දින ගිවිසුම්ගත වී 2017 දෙසැම්බර් 06 දින වැඩ අවසන් කර තිබුණි.

- කාණුව ඉදිකරගෙන යාමේ දී පොළව මට්ටම අනුව ජලය බැස්සවීම සඳහා ගතහැකි උපරිම දුර අඩි 125 ක් බව තාක්ෂණ නිලධාරීන් අනාවරණය කර තිබුණද, වැඩ සැලසුම් කිරීමේ දී කාණුව ඉදි කළ හැකි උපරිම දුර නිවැරදිව හඳුනා නොගෙන ඇස්තමේන්තු සැකසීම නිසා එය අධි ඇස්තමේන්තුවක් වී තිබුණි. මේ අනුව ඇස්තමේන්තු ප්‍රමාණයෙන් සියයට 53 ක වැඩ ප්‍රමාණයක් සිදුකර නොතිබුණු අතර ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් සියයට 50 කටත් වඩා වැඩි ප්‍රමාණයක් උපයෝජනය කරගැනීමට නොහැකි වී තිබුණි.

- මෙම කාණුව ඉදි කිරීමේ අරමුණ වූයේ වැස්ස නිසා නිවෙස් වල රැඳෙන ජලය පහල ප්‍රදේශයට බැස්සවීම වුවද, මෙම කාණුව උස් ප්‍රදේශයක සිට පහලට ගමන් කරන ප්‍රධාන කාණුවට සම්බන්ධ කිරීමේදී ජලය ගලන දිශාවට හැඩ කර සකස් නොකිරීම නිසා ප්‍රධාන කාණුවේ ගලන ජලය මෙම කාණුව දිගේ ආපසු ගලා ඒමෙන් අසල නිවෙස්වලට ජලය ගලන බව නිරීක්ෂණය විය.

(ඇ) අපේක්ෂිත අරමුණු ඉටුනොවූ ව්‍යාපෘති

--------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිමකර තිබූ පහත සඳහන් ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටු නොවී පැවති බව නිරීක්ෂණය විය.

(i) හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

------------------------------------------

- 2015 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගම් නගා සිටුවීම වැඩසටහන යටතේ අත්තරගොඩ හීන් ඇළ ප්‍රතිසංස්කරණය කිරිමේදී ඇළ, මීටර් 275 ක් දුරට හාරා දෙපස කිතුල් පටි සවි කිරීම සඳහා රු.338,725ක වැඩ වටිනාකමින් ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර තිබුණි. ඇස්තමේන්තු ප්‍රකාර දිග මීටර් 275 ක් දුරට ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ව පැවතුණ ද, දිග මීටර් 225 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි.

- මෙම ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ මූලික අරමුණ වූයේ පුරන් කුඹුරු අස්වැද්දීම වුවද, ඇළ ප්‍රතිසංස්කරණය කර වර්ෂ 02 ක් ඉක්මවා ඇති නමුත් එම කුඹුරු අස්වද්දා නොතිබුණ අතර ඇළ මාර්ගය සම්පූර්ණයෙන්ම වල් බිහි වී ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

(ii) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

---------------------------------------------------

පුරන් කුඹුරු අස්වද්දා වී අස්වනු වැඩි ප්‍රමාණයක් ලබා ගැනීමේ අරමුණු ප්‍රකාරව මීටර් 1,135 ක දිගින් යුතු බද්දරමුල්ල යාය ඇල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.472,007 ක වැඩ වටිනාකමක් යටතේ මැටිවල පරපේ ග්‍රාම සංවර්ධන සමිතිය සමග 2017 ඔක්තෝබර් 06 දින ගිවිසුම්ගතවී 2017 දෙසැම්බර් 21 දින වැඩ නිමකර තිබුණි. 2018 මැයි 22 දින විගණන අවස්ථාව වන විට මෙම ඇල ආරම්භයේ සිට මීටර් 200 ක් පමණ කොටස වල් බිහිවී තිබුණු අතර ජලය ප්‍රමාණවත් පරිදි බැස නොයන බව නිරීක්ෂණය විය. පුරන් කුඹුරු අස්වැද්දීම ව්‍යාපෘතියෙහි අරමුණ වුවත් විගණන අවස්ථාව වන විටත් කුඹුරු අස්වැද්දීම සඳහා ආරම්භයක් හෝ සිදුකර නොතිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟා වීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළ මෙන්ම 2018 මැයි 31 දින වන විටත් තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 ක්‍රියාත්මක කර තිබුණු දේශීය ආධාර ව්‍යාපෘති

---------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 12 ක් සඳහා එකතුව රු. මිලියන 2,918.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, මින් හදිසි ආපදා - ගංවතුර යටිතල පහසුකම් පුනරුත්ථාපනය සඳහා ලබාදුන් ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,739.15 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.5 අවිධිමත් ගනුදෙනු

-----------------------

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජ්‍යෝතිෂ්‍ය පුස්තකාලයක් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය හා පුස්තකාල පොත් වෙනුවෙන් රු.1,350,000 ක් වැය කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම පුස්තකාලය මහල් තුනකින් යුත් පුද්ගලික ගොඩනැගිල්ලක දෙවන මහලෙහි වර්ග අඩි 600 ක පමණ පරිශ්‍රයක් තුළ පිහිටා තිබුණු අතර එම පුස්තකාල පරිශ්‍රයේ ප්‍රමාණයේ අවශ්‍යතාවය ඉක්මවා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

(ii) මෙම පුස්තකාලය ඇතුළු ස්වේච්ඡා සංවිධානය පවත්වාගෙන ගොස් තිබූ ගොඩනැගිල්ල හා ඉඩම 2015 වර්ෂයේ දී වෙනත් පුද්ගලයෙකුට විකුණා තිබූ අතර වර්තමානයේ දී එහි වෙනත් ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යමින් තිබුණි. ඒ අනුව පොදු කටයුත්තක් සඳහා රජයෙන් ලබා දුන් ආධාර පුද්ගලික පරිහරණය සඳහා යොදාගෙන තිබුණි.

## 2.6 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකු විසින් ව්‍යාජ අත්සන් යොදා 2006 සැප්තැම්බර් 05 දින සිදුකරන ලද රු. 815,650 ක චෙක්පත් වංචාවක් සිදු කර තිබුණි. අදාළ පාඩුව සිදුවී වසර 11ක පමණ කාලයක් ගතවී ඇතත්, එම පාඩුව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද නොහැකි වී තිබුණි.

(ආ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයකට 2001 ජුනි මස 26 දින සිදුවී තිබූ අනතුර සම්බන්ධයෙන් ගාල්ල දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවට අදාලව විත්තිකාරියගෙන් රු.130,168 ක අලාභය සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් ආයතනය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 3.1(අ)(ii) | මාර්ග කාපට් කිරීම සඳහා 2011 හා 2013 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු.139,333,203 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |
| 2015 | 3.4.2(ඇ) | (i) බටපොල දිසා රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, උපදේශන සේවා ගාස්තු හා ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු දීමනා ලෙස රු.1,440,507 ක් වියදම් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි වැඩ ආරම්භ කර නොතිබුණු නමුත්, ගෙවන ලද අත්තිකාරම් මුදලද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | (ii) අම්බලන්ගොඩ කහටපිටිය ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, උපදේශන සේවා ගාස්තු හා ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටු දීමනා ලෙස රු.1,325,945 ක් වියදම් දරා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වනවිට මෙහි ගිවිසුම් කාලය ඉකුත් වී තිබුණු අතර ඉහත ගෙවීම් සිදුකර වසර 2 කට වැඩි කාලයක් ගතවී ඇතත්, ව්‍යාපෘතියේ වැඩ සියයට 20 ක ප්‍රමාණයට හෝ නිමකර නොතිබුණි. |
| 2016 | 3.8 | 1999 වර්ෂයේදී ගම් පුළුල් කිරීමේ වැඩසටහනට අදාළව අක්කර 467 රූඩ් 1 පර්චස් 26 ක් වූ ඇප්තොප් වත්ත ඉඩම අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර 2016 වර්ෂය වන විට අක්කර 61 පර්චස් 142 ක් පමණ අදාළ වැඩසටහන යටතේ බෙදා දී තිබුණද, තවත් අක්කර 01 පර්චස් 58 ක් අරමුණට පටහැනිව හෝටල් කර්මාන්තය සඳහා ලබා දී තිබුණි. ඉඩම අත්කර ගෙන වසර 18 ක් ගත වී ඇතත්, ව්‍යාපෘතියේ කටයුතු සාර්ථකව නිම කර නොතිබූ අතර එම ඉඩම් අනවසර කරුවන් යටතේ පැවතුණි. දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් ලබා දී තිබූ රු.1,585,625 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |

**2.8 කළමනාකරණ දුර්වලතා**

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

----------------------------

(i) 2017 මැයි මස බලපෑ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් "ගංවතුරෙන් හා නායයෑම්වලින් හානියට පත් ප්‍රදේශවල පුනරුත්ථාපන හා නැවත ඉදි කිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" යන මැයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද අනුමැතිය ප්‍රකාරව රු. මිලියන 1,995 ක ප්‍රතිපාදන ලැබී තිබුණි.

- මේ සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර තිබූ 2017 අගෝස්තු 22 දිනැති MNPEA 04/2017 දරන චක්‍රලේඛයට අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත සියළු දෙනාට සමාන අවස්ථා ලැබෙන ආකාරයට කොන්ත්‍රාත් පිරිනැමීම කළයුතු වුවද, කොන්ත්‍රාත් පැවරීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

- සියළු ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබූ අතර, මින් වටිනාකම රු.මිලියන 255.67 ක් පළාත් සභා මාර්ග අළුත්වැඩියාව සම්බන්ධයෙන් කොන්ත්‍රාත් සඳහා දකුණු

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ද, වටිනාකම රු.මිලියන 828.38 ක් ජාතික මාර්ග අළුත්වැඩියාව කොන්ත්‍රාත් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණයට යටත්ව කොන්ත්‍රාත්කරුවන් සමඟ ද ගිවිසුම් වලට එළඹ තිබුණි. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවලට අදාළ ඇස්තමේන්තු සැකසීම එම අධිකාරිය විසින්ද, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග වල ඇස්තමේන්තු සැකසීම එම අධිකාරිය විසින්ද, සිදුකර තිබුණද මෙම ඇස්තමේන්තුවල නිවැරදිතාවය ස්වාධීන ආයතනයක් ලවා පරීක්ෂා කරවා ගෙන නොතිබුණි. එසේම ගිවිසුම් ප්‍රකාරව අධීක්ෂණය හා තාක්ෂණික උපදේශනය සම්බන්ධ සම්පූර්ණ වගකීම පළමු පාර්ශවය (දිස්ත්‍රික් ලේකම්) සතු වුවද, නිසි අධීක්ෂණයක් සිදුවූ බවට සාක්ෂි නොවීය.

- මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඇතැම් මාර්ග සැකසීම අදියර කිහිපයකට වෙන්කර එකම කොන්ත්‍රාත් කරුවෙකුට එකවර පැවරී තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

- අවබෝධතා ගිවිසුමේ 6 වගන්තිය අනුව ව්‍යාපෘතියේ අධීක්ෂණය හා තාක්ෂණික උපදේශනය සම්බන්ධ සම්පූර්ණ වගකීම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇතත්, අධිකාරිය කොන්ත්‍රාත්කරු ලෙස කටයුතු කරන බැවින් එහි අධීක්ෂණය ස්වාධීන පාර්ශවයක් විසින් ඉටු කර නොතිබුණි.

- යථෝක්ත චක්‍රලේඛයට අනුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත් අවසන් කළ යුතු ව්‍යාපෘති 6 ක කොන්ත්‍රාත් කටයුතු 2018 ජනවාරි මස වන විට දී ආරම්භ කර හෝ නොතිබුණි. ඊට අමතරව, ව්‍යාපෘති 12 ක කොන්ත්‍රාත් කටයුතු නිම වූ ප්‍රතිශතය සියයට 25 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

- මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද මාර්ග නවීකරණ ව්‍යාපෘති අතර කඩිනම් යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති නොවන සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ කළ යුතු ව්‍යාපෘතිද ඉටුකර තිබුණි. මෙසේ මාර්ගය සඳහා ඇස්තමේන්තු සැකසීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත මිල ගණන්වලට වඩා ඉහළ අගයක් ගෙන තිබූ දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මිල ගණන් යොදා ගෙන තිබුණි. ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් සපයා අතුරන ලද ඇස්පෝල්ට් තට්ටුවෙන් ලබාගත් ඝනකම පදනම් කරගැනීම වෙනුවට ඇස්තමේන්තු මිල පදනම් කරගෙන ගෙවීම හේතුවෙන් රු.4,869,808 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. මෙලෙස ඇස්පෝල්ට් කෝස් සඳහා ගෙවීම් කිරීමේදී කැපුම් සාම්පල් වල පැවති සාමාන්‍ය තත්ත්වය මත ගණනය කර ගෙවීම් නොකිරීම හේතුවෙන් කර්මාන්ත 7 ක් වෙනුවෙන් රු.2,487,893 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, ගෙවීම් කිරීමේදී ඇස්පෝල්ට් තට්ටුවේ සුසංහසනය (compaction) අනුමත ප්‍රතිශතයට වඩා අඩු අවස්ථාවලදී ද ඒ පිළිබඳව නොතකා ගෙවීම් කර තිබුණි.

(ආ) නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

------------------------------------------

(i) බටුවංගල කුරුඳුවත්ත ඉඩම අක්කර 07 ක ප්‍රමාණයෙන් යුතු වූ අතර ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ ඉඩම් නොමැති අයට බෙදා දීමේ අරමුණින් රජයට අත්කර ගැනීමේ කටයුතු 2001 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, 2017 වර්ෂය අවසාන වන විටත් ඉඩම් හිමිකම් කියන්නන් හඳුනා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි. මෙහි ඉඩම් කැබලි 52 කට බෙදා තිබූ අතර ඉන් කැබලි 42 ක් 2003 වර්ෂයේ ගංවතුරෙන් විපතට පත්වූවන්ට ලබා දී තිබුණි. 2017 ඔක්තෝබර් වන විට මෙම ඉඩම් කැබලිවලින් කැබලි 23 ක් සඳහා බලපත්‍ර ලබා දී නොතිබුණි.

(ii) තවලම - නෙළුව - බටුවංගල මාර්ගයේ අංක 9/5 පාලම නැවත ඉදි කිරීම සඳහා හෙක්ටයාර් 0.1316 ක් වූ ඉඩම අත්කර ගැනීමේ කටයුතු 2013 වර්ෂයේ ආරම්භ කර තිබුණි. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය 2014 මාර්තු 10 නිකුත් කර තිබූ අතර 2017 ඔක්තෝබර් 20 වන විට පාලමේ ඉදි කිරීම් වැඩ නිම කර තිබුණද, ඒ වන විටත් පනතේ 07 වන වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමියන් හඳුනා ගෙන ඉඩම් අත්කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(iii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ රක්ෂිතයක් පවත්වාගෙන යාම සඳහා හිඟුරුව ගමෙහි පිහිටි හෙක්ටයාර 48.946 ක් වූ, කිරිමානාකැටිය නම් ඉඩම රජයට අත්කර ගැනීමේ කටයුතු 1996 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. මේ වනවිට වසර 20 ක පමණ කාලයක් ගත වුවද, හිමිකම් පරීක්ෂණ පැවැත්වීම, වන්දි ගෙවීම, ඉඩමෙහි භුක්තිය භාර දීම, ආදී කටයුතු 2017 වර්ෂයේ අවසාන වන විටද ප්‍රමාද වෙමින් පැවතුණි.

(iv) 2011 හා 2013 වර්ෂ වලදී පැවති ඉඩම් කච්චේරි ක්‍රමය අනුව හඳුනාගෙන තිබූ ඉඩම් නොමැති පුද්ගලයින් ගණන 1,464 ක් වූ අතර එම පුද්ගලයින් හට මෙතෙක් ඉඩම් ලබා දීමට නොහැකි වී තිබුණි. ඉඩම් කච්චේරි මගින් හඳුනාගෙන තිබූ අනවසරයෙන් අල්ලා ගන්නා ලද පර්චස් 20 ත්, 82ත් අතර ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කට්ටි 19 ක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට යෝජනා වී තිබුණි. ඉන් ඉඩම් කට්ටි 14 ක් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය වෙත යවා තිබුණද, ඒ සඳහා ද අනුමැතිය ලැබී නොතිබුණි. තවත් ඉඩම් කට්ටි 04 කට දීර්ඝ කාලීන බදු දීම පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

-----------------------------------------------

(i) බොරකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 5 යි රූඩ් 1 යි පර්චස් 1 කින් යුත් පුංචි බොරකන්ද වත්ත ඉඩම, ටී.ඩී. සමරවීර ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා 2006 වර්ෂයේ දී රජයට පවරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. ඉඩම් අත්කර ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි 460 වැනි පරිච්ඡේදයේ 2 වැනි වගන්තිය යටතේ වන දැන්වීම 2007 පෙබරවාරි 26 දින ප්‍රසිද්ධ කර තිබුණ ද, ඊට අදාලව සකස් කරන ලද ප්‍රගමන අනු රේඛනයෙහි අත්කර ගැනීමට යෝජිත ඉඩමෙහි ප්‍රමාණය හෙක්ටයාර 0.285 ක් ලෙස සඳහන් කර තිබීම නිසා එය පදනම් කරගෙන 2007 දෙසැම්බර් 31 දින අදාල ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි 38(අ) අතුරු

විධානය නිකුත් කර තිබුණි. ඒ අනුව අත්කර ගැනීමට යෝජිතව තිබූ ඉඩම් ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් සඳහන්ව 38(අ) අතුරු විධානය නිකුත් කිරීම නිසා අදාල ඉඩම් කොටස් ඒ ඒ රාජ්‍ය ආයතනවලට පවරා දීම ගැටළුවක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් ඉඩම් අමාත්‍යාංශය විසින් 2015 ජුලි 28 දාතමින් ප්‍රගමන අනුරේඛනය සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 18 දින වන විටත් එම උපදෙස් ලැබී වසර 2 ක් ඉක්මවා තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) කරන්දෙණිය නගර සංවර්ධනය සඳහා මහජ්දණ්ඩ ග්‍රාමයේ පරවෙල නැමැති ඉඩමෙන් අක්කර 02 ක ප්‍රමාණයක්, කරන්දෙණිය ප්‍රාදේශීය සභාවට ලබා දීමේ අරමුණින් යුතුව 1986 වර්ෂයේදී රජයට අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර තිබුණි. ඉඩම් අත්කර ගැනීමේ දී වන්දි ලැබිය යුතු පුද්ගලයින් 05 දෙනෙකු වෙත රු.960,000 ක වන්දි මුදල් ගෙවීමට තීරණය කර තිබූ නමුත්, ඉඩම් අයිතිය සම්බන්ධව පැවැති අවිනිශ්චිතතාවයන් හේතුවෙන් වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කර තිබුණි. ප්‍රාදේශීය සභාවෙන් නියමිත පරිදි මුදල් නොලැබීම මත වන්දි ගෙවීමේ කටයුතු මේ වන විට අතරමග නැවතී තිබුණු අතර එම මුදල් ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබුණි. වන්දි ගෙවීමට ප්‍රමාද කිරීම් තුළ අමතර පොලියක් ගෙවීමට සිදු වී තිබුණි. අත්කර ගන්නා ලද ඉඩමෙහි, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධනයන් සිදු කර ආදායම් උපයා ගන්නා නමුත්, ඉඩම් අහිමි වූවන් තම ඉඩම් සඳහා වසර ගණනාවක් තිස්සේ කිසිදු ප්‍රතිලාභයක් ලබා ගෙන නොතිබුණි.

(ඈ) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
---------------------------------------------

(i) 2006 වර්ෂයේ දී සුනාමි ගම්මාන 03 ක් ඉදිකර අවතැන් වූවන් සඳහා නිවාස 74 ක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- නිවාස 66 ක් සඳහා හිමිකම් නිරවුල් කර අදාල ප්‍රතිලාභීන් වෙත ඔප්පු නිකුත් කිරීමට 2017 අගෝස්තු වන විටත් කටයුතු කර නොතිබුණි.
- මීරිස්වත්ත, මහකුරුන්ද, ගැමුණුපුර සුනාමි ගම්මානයේ නිවාස 15 අතුරින් නිවාස 08 ක අදාල හිමිකරුවන්, මෙම නිවාස වෙනත් පාර්ශවයන් වෙත මාසික කුලී පදනම මත ලබා දී තිබුණි. ව්‍යාපෘතියෙහි නිවාස 04 ක් භාවිතා නොකර තිබූ අතර ඉන් 02 ක් පදිංචියට නුසුදුසු තත්ත්වයට පත්වී තිබුණි.
- නෙළුම් පොකුණ U.S.A නිවාස සංකීර්ණය හා පාරමිතා නිවාස සංකීර්ණයේ නිවාස 49 ක් ඉදි කර, ඒ අතරින් නිවාස 13 ක් සුනාමි ව්‍යසනයට ලක් නොවූ පුද්ගලයින් සඳහා ලබාදී ඇති බව ග්‍රාම නිලධාරී වාර්තා අනුව තහවුරු විය. මෙම නිවාස සංකීර්ණයේ නිවාස 03 ක් වෙනත් පාර්ශවයන් හට විකුණා තිබුණි.

(ii) පැරඩයිස් අයිලන්ඩ්, ධීවර පාර, බෙන්තොට යන ලිපිනයෙහි ප්ලෝටින් රෙස්ටුරන්ට් නමින් පවත්වාගෙන යන දියමත පාවෙන අවන්හල, තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස 2012 වර්ෂයේ පෙබරවාරි මස 03 දින ලියාපදිංචි කර තිබුණි. ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනස් වීම හා විරෝධතාවන් සලකා බලා 2012 නොවැම්බර් මාසයේ දී එම ලියාපදිංචිය අවලංගු කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම කිසිදු බලපත්‍රයක් නොමැතිව මෙම පාවෙන අවන්හලෙහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගියද, වගකිවයුතු නිලධාරීන් විසින් මේ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
------------------------------------------

(i) පෞද්ගලික කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා කොග්ගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෝදර වැල්ලවත්ත නැමති රජයේ ඉඩමෙන් පර්චස් 10 ක් දීර්ඝකාලීන බදු පදනම මත පුද්ගලයෙකු වෙත ලබා දී තිබුණි.

- මේ සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස්ගේ උපදෙස් අනුව හබරාදූව ප්‍රාදේශීය සභාව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යන ආයතනවල එකඟතාව ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එහෙත්, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පෞද්ගලික කැස්බෑ මධ්‍යස්ථානයක් සඳහා අනුමැතිය ලබා දීමට නොහැකි බව දන්වා තිබියදී වන ජීවී සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක රහිත අනුමැතිය ලබා දීමේ ලිපිය අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දීර්ඝකාලීන බදු පදනම මත අවුරුදු 30 ක කාලයකට මෙම ඉඩම බදු දී තිබුණි.

- 2009 අංක 22 දරන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධිත) පනතෙහි 45 (ඇ) වගන්තිය යටතේ තර්ජනයට ලක්වී ඇති හෝ වඳ වී යාමට ඉඩ ඇති සත්ත්ව විශේෂ පුනරුත්ථාපනය හා සංරක්ෂණ සඳහා බලය පැවරිය යුතු වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වුවද, එවැනි බලය පැවරීමක් සිදුකර නොතිබුණි.

- මේ සම්බන්ධ භෞතික පරීක්ෂාවේ දී, ලබා දී තිබූ රජයේ ඉඩමට අමතරව ඒ ආසන්නයෙහි පැවති රජයේ ඉඩමද අනවසරයෙන් භුක්ති විඳින බව නිරීක්ෂණය විය.

(ඊ) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
------------------------------------------------

ග්‍රාම නිලධාරී වසම් 03 කට අයත් හෙක්ටයාර් 93.42 ක ඉඩම් ප්‍රමාණයක් අම්බලන්ගොඩ නගර සංවර්ධනය සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ අවශ්‍යතාවය මත 1988 සැප්තැම්බර් 23 දින අංක 524/23 දරන ගැසට් පත්‍රයෙහි, ඉඩම් අත්කර ගැනීමේ ආඥා පනතේ 38 (ආ) අතුරු විධානය නිකුත් කිරීම මගින් රජයට අත්කර ගෙන තිබුණි. මේ වන විට ඉඩම අත්කර ගෙන වසර 30 ක පමණ කාලයක් ගත වී ඇතත්, එම ඉඩමෙන් හෙක්ටයාර් 65 ක පමණ භූමි ප්‍රමාණයක් සඳහා හිමිකම් පරීක්ෂණ පවත්වා වන්දි ගෙවීම් අවසන් කර නොතිබුණි. හිමිකම් පරීක්ෂණ නිම කර තිබූ හෙක්ටයාර් 13.19 ක පමණ භූමි ප්‍රදේශයක් සඳහා රු. මිලියන 19.72 ක වන්දි මුදලක් තක්සේරු කර තිබුණ ද, ඉඩම් හිමියන් වෙත එම මුදල් ගෙවා නොතිබුණි. දීර්ඝ කාලයක් තිස්සේ

වන්දි ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ඉඩම් හිමියන් අපහසුතාවයට පත් වී තිබුණි. එසේම, 2018 අගෝස්තු 31 දින වන විට ඉඩම් හිමියන් වෙත ගෙවීමට සිදුවන පොලිය රු.මිලියන 13.78 ක් වී තිබුණි. තවද, අත්කර ගත් මුළු ඉඩමෙන් හෙක්ටයාර් 81.11 ක භූමි ප්‍රමාණය අපේක්ෂිත ඵලදායී සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2.9.1 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 1,014.98 | 1007.6 | 7.38 | 0.73 |
| | මූලධන | 60.76 | 60.06 | 0.69 | 1.14 |
| | **එකතුව** | **1,075.74** | **1,067.66** | **8.07** | **0.75** |
| 2014 | පුනරාවර්තන | 890.58 | 884.42 | 6.16 | 0.69 |
| | මූලධන | 45.80 | 45.62 | 0.18 | 0.39 |
| | **එකතුව** | **936.38** | **930.04** | **6.34** | **0.67** |
| 2015 | පුනරාවර්තන | 1042.30 | 1037.71 | 4.59 | 0.44 |
| | මූලධන | 78.00 | 47.28 | 30.72 | 39.38 |
| | **එකතුව** | **1,120.30** | **1,084.99** | **35.31** | **3.15** |
| 2016 | පුනරාවර්තන | 1,079.00 | 1,074.73 | 4.27 | 0.39 |
| | මූලධන | 78.00 | 77.19 | 0.81 | 1.04 |
| | **එකතුව** | **1,157.00** | **1,151.92** | **5.08** | **0.43** |
| 2017 | පුනරාවර්තන | 1,074.71 | 1,068.79 | 5.92 | 0.55 |
| | මූලධන | 2,120.20 | 380.56 | 1739.64 | 82.05 |
| | **එකතුව** | **3,194.91** | **1,449.35** | **1745.56** | **54.63** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

---

සමාලෝචිත වර්ෂයේදී ගංවතුර හා නායයෑම් ආපදාවලින් හානියටපත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සඳහා වර්ෂය අවසානයේදී ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශක්‍යතා අධ්‍යනයට, ප්‍රසම්පාදනයට හා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිවීම නිසා සලසා තිබුණු රු.මිලියන 1,995.2ක මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 248.44ක් හෙවත් සියයට 12 ක් කිසිදු ව්‍යාපෘතියකට යොදවා නොතිබුණි.

**2.9.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

---

වෙනත් අමාත්‍යාංශ 26 ක්, දෙපාර්තමේන්තු 20 ක් හා කාර්යාල 02 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙළින් රු. මිලියන 3,531.75 ක්, රු.මිලියන 268.49 ක් හා රු.මිලියන 41.75 ක් වශයෙන් එකතුව රු. මිලියන 3,841.99 ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 2,799.75 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,042.23 ක් හෙවත් සියයට 27.13 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ආපදා සහන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක් (තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර) සඳහා එකතුව රු.648,000 ක් වටිනා ටැබ් පරිගණක ඇතුළු උපකරණ කට්ටල 18 ක් 2016 වර්ෂයේ මාර්තු මාසයේදී ආපදා සහන නිලධාරීන් වෙත ලබා දී තිබුණි. එහෙත් එම පරිගණක උපකරණ කට්ටල භාවිතය පිළිබඳව විධිමත් පුහුණුවක් ආපදා සහන නිලධාරීන් වෙත ලබා නොදීමත්, මෙම තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අන්තර්ජාල පහසුකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොතිබීමත් හේතුවෙන් තොරතුරුවලට ප්‍රවේශ වීම්, තොරතුරු ඇතුළත් කිරීම හා ඒවා යාවත්කාලීන කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් ගාල්ල දිස්ත්‍රික්කයේ වතුගෙදර - සීනිගොඩ මාර්ගය හා විද්‍යා සමාධි පිරිවෙණ අසල මාර්ගය නවීකරණ කටයුතු සිදුකර තිබුණි. අදාළ කොන්ත්‍රාත්කරුට එකතු කළ අගය මත බදු මුදල් ලෙස රු.1,991,716 ක් ගෙවා ඇතත් කොන්ත්‍රාත්කරුගෙන් විධිමත් බදු ඉන්වොයිස් ලබාගෙන නොතිබුණු අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු මුදල් ගෙවූ බවට තහවුරු කරගැනීමට නොහැකි වුණි.

(ඇ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3කට අයත් ප්‍රජා මූල බැංකු 10 ක ණය වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. 2017 අගෝස්තු 31 දින වන විට ප්‍රතිලාභීන් 682 දෙනෙකුගෙන් අය විය යුතු රු.20,930,093 ක ණය ශේෂ කල් පසු වූ ණය ලෙස හඳුනාගෙන තිබූ අතර එම ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිපාදනවලින් ගාල්ල දිස්ත්‍රික්කයේ ගංවතුරින් ආපදාවට ලක් වූ ප්‍රදේශවල යටිතල පහසුකම් නඟා සිටුවීම සඳහා රු.මිලියන 400.00 ක මුදලක් ගාල්ල දිස්ත්‍රික්කය වෙත ලබාදී තිබූ අතර ඉන් රු.මිලියන 291.24 ක් වූ මුදලක්, ව්‍යාපෘති 202 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. එම මුදලින් රු.මිලියන 240.44 ක් වටිනා ව්‍යාපෘති 199 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් රු.මිලියන 45.05 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ව්‍යාපෘති 69 ක පමණක් 2018 ජනවාරි 05 දින වන විට වැඩ නිමකර තිබුණි. රු.මිලියන 32.85 ක වටිනාකමක් සහිත ව්‍යාපෘති 27 ක කොන්ත්‍රාත් කටයුතු ආරම්භ කර තිබුණද, 2018 මාර්තු 19 දින වන විටත් අවසන් කර නොතිබුණි. තවද, එකතුව රු.මිලියන 162.54 ක් වටිනා ව්‍යාපෘති 103 ක කොන්ත්‍රාත් කටයුතු 2018 මාර්තු 19 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඉ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිපාදන මඟින් ඉමදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඳුරන්නවිල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ජම්බුගහවත්ත අත්තම් නිවාස මාර්ගය තාර දැමීම, කාණු පද්ධතිය ඉදි කිරීම හා බෝක්කුව ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.1,523,576 ක් වී තිබූ අතර කොට්ඨාසයේ පිහිටි ප්‍රජා පාදක සමිතියක් සමඟ කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද, වෙනත් බාහිර පාර්ශවයක් විසින් කොන්ත්‍රාත්තුව ඉටුකර තිබූ අතර කර්මාන්තයෙහි පවතින අඩුපාඩු පිළිබඳ වගකීම, ගිවිසුම්කාර සමිතිය විසින් බාරගෙන නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඇස්තමේන්තුවෙහි වැඩ විෂය අංක 22 ප්‍රකාරව, කම්බි දමන ලද 1:2:4(3/4) මිශ්‍රණ අනුපාතයකින් හා ඇතුලත සුමට මතුපිටක් සහිත ඝන මීටර් 24.7 ක කොන්ක්‍රීට් පෘෂ්ඨයකින් යුතුව කාණුව ඉදි කළ යුතු වුවද, පහත සඳහන් අඩුපාඩු තිබියදී කොන්ත්‍රාත්කරු වෙත රු.847,806 ක් ගෙවා තිබුණි.

- පතුලට යොදා තිබුණු කොන්ක්‍රීට් පෘෂ්ඨය බොල්වී තිබුණු අතර එය කැඩී ගොස් තිබුණි.
- කාණුවෙහි බිත්ති තැනින් තැන පුපුරා තිබුණි.
- කොන්ක්‍රීට් පෘෂ්ඨයෙහි ශක්තිය නියමිත අගයන් වලට පවතීද යන්න තහවුරු කර නොතිබුණි.

(ii) ඇස්තමේන්තුවෙහි අංක 9 සිට 18 දක්වා වැඩ විෂයන් ප්‍රකාරව පෙට්ටි බෝක්කුව ඉදි කිරීම සඳහා රු.186,341 ක ප්‍රතිපාදන සලසා, එහි වැඩ විෂය අංක 11 ප්‍රකාරව පාදම ඉදිකිරීම සඳහා 1:2:4(3/4) මිශ්‍රණ අනුපාතයෙන් යුතුව ඝන මීටර් 0.86 ක කොන්ක්‍රීට් තට්ටුවක් යෙදීමට සැලසුම් කර තිබුණද, එම වැඩ විෂය සිදුකර නොතිබුණි. බෝක්කුවෙහි යොදා තිබුණු ඝන මීටර් 1.30 ක් වූ කොන්ක්‍රීට් ලැල්ල ස්ථාන කිහිපයකින් ඉරි තැලී තිබුණි.

**2.10 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 86.00 | 85.74 | 57.00 | 66.77 | 235.00 | 219.22 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටිව තිබුණු ණය ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.1,446,210 ක් විය. 2018 ජූලි 31 දින වන විට එම ශේෂය රු. 600,310 ක් වූ අතර එම ශේෂයන් වර්ෂ 01 ත් වර්ෂ 06 ත් අතර කාලයක සිට හිගහිටිව පැවතුණි.

**2.11 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අග්‍රිම ගිණුමෙහි 2006 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණු රු.මිලියන 0.19 ක ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කර නොතිබුණි.

**2.12 පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 435.71 ක් විය. මේ අතුරින් වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.මිලියන170.7 ක් වූ තැන්පතු 339 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.13 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 104 (4) | 525,738 | වර්ෂය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 07 කට අදාළව පිළියෙල කල යුතු වාර්තා, 2018 අප්‍රේල් 03 වන විට අනතුර සිදු වී මාස 03 ත් මාස 12 ත් අතර කාලයක් ගත වී තිබුණද, විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | **ජාතික අයවැය චක්‍රලේඛ උපදෙස් ලිපි** | | |
| | 2015 ජූලි 07 හා 2017 ජනවාරි 06 දිනයන්හි අංක BD/GPS/13/0/9/14/MC-ii හා MC-iii දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ලිපි | 138,500 | යතුරුපැදි ලබා ගත් නිලධාරියෙකු වසර 05ක් ගතවීමට ප්‍රථම වැටුප් රහිත නිවාඩු මත හෝ මාස 06 කට වැඩි වැටුප් සහිත නිවාඩු ලබා ගෙන හෝ විදේශගත වන්නේ නම් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම අයකළ යුතු වුවද, විදේශගත වූ නිලධාරිනියකගෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි. |
| | | 1,560,500 | නිලධාරියෙකු වසර 05 ක් ගතවීමට ප්‍රථම යතුරුපැදි හිමි නොවන තනතුරකට යාමේදී හෝ ඉල්ලා අස්වීමේදී යතුරුපැදියේ වෙළඳ පොළ වටිනාකම අයකළ යුතු වුවත්, එවැනි නිලධාරින් 10 දෙනෙකුගෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20(2) වගන්තිය | 15,746,176 | කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු මුදල් ගෙවීමේ දී ඉදිරිපත්කර තිබූ ඉන්වොයිස්වල නම, ලිපිනය, දිනය, ඉන්වොයිස් අංකය ඇතුලත් නොවීම මත මෙම බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවූ බවට තහවුරු කර ගැනීමට නොහැකි විය. |

**2.14** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**------------------------------------------------------------------------------------------**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 925.4 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.312,003 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 105 | 83 | 22 | - |
| (ii) | තෘතීයික මට්ටම | 44 | 27 | 20 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 2,849 | 2,677 | 214 | 42 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 183 | 173 | 10 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | - | 06 | - | 06 |
| | **එකතුව** | **3,181** | **2,966** | **266** | **51** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම**

**------------------------------------------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 266 ක් පැවැති තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම පුරප්පාඩු පිරවීමට විධිමත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) **අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම**

**------------------------------------------------**

විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් 51 ක් බඳවා ගෙන තිබුණි.

(ඇ) **කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

**-------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළ අවම වශයෙන් පැය 08 කවත් පුහුණු කාලයක් නොලැබූ නිලධාරීන් ගණන 185 ක් පමණ විය.